බාහිර තහවුරු කිරීම - External Confirmations (S.L.Au.S – 505)

- ❖ හැඳින්වීම
- ❖ බාහිර සනාථ කිරීමක් යනු කුමක්ද?
- ❖ කළමනාකාරීත්වය තහවුරු කිරීම්, විමසීම් යැවීමට ඉඩනොදීම
- ❖ බාහිර සනාථ කිරීම් වලින් ලද ප්‍රතිඵල

හැඳින්වීම

S.L.Au.S 500 සාකච්ඡා කරන ලද ආකාරයට

(a) ස්වාධීන මූලාශ්‍රයන් තුළින් ලබාගන්නා විගණන සාක්ෂි වල ඉහළ විශ්වාසනීයත්වයක් ඇත.

(b) විගණක සෘජුව ලබාගන්නා විගණන සාක්ෂි, වක්‍රව ලබාගන්නා සාක්ෂි වලට වඩා ඉහළ විශ්වාසනීයත්යක් ඇත.

(c) ලිඛිතව ලබාගන්නා සාක්ෂි තුළ ඉහළ විශ්වාසනීයත්වයක් ඇත.

මේ අනුව පෙනීයන්නේ විගණක සෘජුව බාහිර මූලාශ්‍රයක් තුළින් ලබාගන්නා බාහිර සනාථ කිරීම් තුළ, ව්‍යාපාරය අභ්‍යන්තරයෙන් ලබාගන්නා සාක්ෂියකට වඩා ඉහළ විශ්වාසනීයත්වයක් ඇත. මේ අනුව මෙම ප්‍රමිත තුළ අප සාකච්ඡා කරනු ලබන්නේ විගණක එවැනි සාක්ෂි ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳවය.

බාහිර තහවුරු කිරීම් යනු කුමක්ද?

ලියකියවිලිල ඉලෙක්ට්‍රෝනික හෝ වෙනත් මාර්ගයක් හරහා තෙවන පාර්ශවයක් තුලින් විගණක සෘජුවම ලබාගන්නා ලිඛිත ප්‍රතිචාරයන් බාහිර තහවුරු කිරීමක් ලෙස හඳුන්වයි

මෙහිදී ප්‍රධාන ක්‍රම 2 ක් යටතේ මෙය සිදුකළ හැක.

(a) ධනාත්මක සනාථන කැඳවීම් ඉල්ලීම (තහවුරු කිරීම්) (Positive Confirmation Request)

අදාළ විමසීමේ /ඉල්ලීමේ දක්වා ඇති තොරතුරු සමග එකගවීම හෝ නොවීම් හෝ අදාළ විමසීමේ /ඉල්ලීමේ ඇති තොරතුරු සපයමින් සෘජු ප්‍රතිචාරයක් විගණකට ලබාදෙන ලෙස තෙවන පාර්ශවයකට කරන ඉල්ලීමක් මින් අදහස් වේ.

(b) සෘණාත්මක තහවුරු කිරීමේ ඉල්ලීම (Negative Confirmation Request)

අදාළ විමසීමේ ඉල්ලීමේ දක්වා ඇති තොරතුරු වලට එකග නොවන්නේ නම් පමණක් සෘජු ප්‍රතිචාරයන් විගණකට ලබා දෙන මෙන් තෙවන පාර්ශ්වයකට කරන ඉල්ලීම මෙහිදි බලාපොරොත්තු වේ.

ඉතා වැදගත්

ඉහත සඳහන් කරනලද ක්‍රම දෙකක අතරින් වඩාත්ම යෝග්‍යම ක්‍රමය වන්නේ ධනාත්මක තහවුරු කිරීම් ක්‍රමයයි. නමුත් ප්‍රායෝගිකව විගණනයන් සිදු කිරීමේදී මෙම ක්‍රම දෙකටම තහවුරු කිරීම් ලබා ගනී.

JMC vLearning "your virtual learning partner"

කළමනාකාරීත්වය, විගණකවරයාට තහවුරු කිරීම විමසීමට ඉඩ ලබා නොදීම

01. මෙවැනි තත්ත්වයකදී විගණක,

(a) අදාළ තහවුරු කිරීම් විමසීමට ඉඩ ලබා නොදීම පිළිබඳව කළමනාකාරීත්වයෙන් විමසීම සිදුකළ යුතු වේ.

(b) එය ප්‍රමාණාත්මක සාවද්‍යතා ඇතිවීමේ අවධානම කෙරෙහි සහ විගණන ක්‍රියාපටිපාටි වල ස්වභාවය, කාලය සහ තරම කෙරෙහි ඇතිකරන බලපෑම සළකා බැලීම.

(c) අතිරේඛ විගණන ක්‍රියාපටිපාටි මගින් සාක්ෂි ලබා ගැනීමට උත්සහ කිරීම.

02. කළමනාකාරීත්වය අසාධාරණ හේතුවක් මත, විගණකට තහවුරු කිරීම විමසීම් ලබාගැනීමට ඉඩලබා නොදෙන අවස්ථාවකදී හා අනිකුත් විගණන ක්‍රියාපටිපාටි මගින් විගණකට ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබාගත නොහැකිවීම.

(a) ව්‍යාපාරයේ යහපාලනය පිළිබඳව වගකීම දරණ පාර්ශවයන්ව දැනුවත් කිරීම.

(b) එය විගණන මතය සඳහා ඇතිකරන බලපෑම සළකා බැලීම.

බාහිර සනාථ කිරීම් විමසීම් වලින් ලද ප්‍රතිඵල

මෙහිදී විගණක බාහිර සනාථ කිරීම් විමසීම් වලින් ලද ප්‍රතිඵල වල විශ්වාසනීයත්වය සළකා බැලිය යුතු වේ. එහිදී යම්කිසි ගැටලුකාරී තත්ත්වයක් මතු වූ විට ඒවා නිරාකරණය කර ගැනීමට උත්සහ කළ යුතුය.

මෙහිදී බාහිර සනාථ කිරීම් විමසීම් සඳහා ප්‍රතිචාරයන් නොලද විට විගණකට ඇතිරේඛ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට සිදු වේ.

අතිරේක සටහන්

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....